# මාලු මිරිස් වගාවේ කල්පිටිය ප්‍රදේශයට විශේෂිත පෝෂක කළමනාකරණය



**හැඳින්වීම:**

එළවළු වගාව කෘෂිකාර්මික පද්ධතිවල අත්‍යවශ්‍ය අංගයක් වන අතර එය ආහාර සුරක්ෂිතතාවයට සහ ගොවීන්ගේ ජීවනෝපායන්ට සෘජුවම බලපායි. වගා කරන බොහෝ එළවළු අතර මාලු මිරිස් විශේෂ ස්ථානයක් ගන්නා අතර පුත්තලම (කල්පිටිය) ප්‍රදේශයේ ප්‍රධාන බෝගයක් ලෙස වගා කෙරේ.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වත්මන් පොහොර නිර්දේශයන් විවෘත පරාගිත එළවළු වගාව සඳහා මූලික මාර්ගෝපදේශ සපයයි. එහෙත් වර්තමානයේ බොහෝ ගොවීන් අතර දෙමුහුම් ප්‍රභේද ප්‍රචලිත වී ඇති අතර ඒ සඳහා මෙම පොහොර නිර්දේශය ප්‍රමාණවත් නොවේ. පසෙහි පෝෂක සංයුතිය, pH මට්ටම, තෙතමනය රඳවා තබා ගැනීම සහ ශාක සෞඛ්‍යයට සහ ඵලදායිතාවයට බලපාන අනෙකුත් ලක්ෂණ ප්‍රදේශ අනුව සැලකිය යුතු ලෙස වෙනස් වන බැවින්, සාමාන්‍ය පොහොර නිර්දේශය රටේ සියලුම කලාපවල මාලුමිරිස් වගාවල ප්‍රශස්ත වර්ධනයට ඵලදායී ලෙස දායක නොවේ.

මෙම සීමාවන් සපුරාලීම සඳහා, කල්පිටිය ප්‍රදේශයේ ගොවීන්ගේ ක්ෂේත්‍රවල සිදුකරන ලද පරීක්ෂණ මත පදනම්ව කල්පිටියේ මාලුමිරිස් වගාව සඳහා ප්‍රදේශයට විශේෂිත පොහොර පැකේජයක් මෙහි දක්වා ඇත.

## විශේෂිතවූ පොහොර පැකේජය :

කල්පිටියේ, ප්‍රමුඛ පස් වර්ගය රෙගොසෝල් (එන්ටිසෝල්) එනම් වැලිමය පසක් වන අතර එය සරු බවින් අඩු, කාබනික ද්‍රව්‍ය අඩු, පෝෂක වේගයෙන් කාන්දුවන සහ වේගවත් ජලාපවහනයකින් යුත් පසක් වේ. මෙම පසෙහි pH අගය උදාසීන සිට ක්ෂාරීය පරාසය (6.8 - 8.5) අතර වේ.

මාලු මිරිස් ශාකය හොඳින් ජලය බැස යන, සාරවත් සහ pH 5.5-6.8 අගයක් සහිත ලෝම පසෙහි හොඳින් වර්ධනය වේ. පසෙහි කාබනික ද්‍රව්‍ය ඉහළ මට්ටමක තිබිය යුතු බැවින් කල්පිටිය පසට කාබනික ද්‍රව්‍ය එකතු කිරීම අවශ්‍ය වේ. හොඳින් දිරාපත් වූ කාබනික ද්‍රව්‍ය එම පසට එකතු කිරීම මගින් පසෙහි ව්‍යුහය වැඩි දියුණු කළ හැකිය. තවද තෙතමනය රඳවා තබා ගැනීම වැඩි දියුණු කළ හැකි අතර පසෙහි ප්‍රයෝජනවත් ක්ෂුද්‍රජීවී ක්‍රියාකාරිත්වය ප්‍රවර්ධනය කළ හැකිය.

ප්‍රශස්ත ලෙස පෝෂක ලබා ගැනීම සහතික කිරීම සඳහා පැළ සිටුවීමට දිනකට පෙර මූලික පොහොරක් ලෙස ත්‍රිත්ව සුපර් පොස්පේට් (TSP), යූරියා සහ මියුරේට් ඔෆ් පොටෑෂ් (MOP) යෙදීම සිදු කල යුතුය. සිටුවීමට පෙර TSP යෙදීමෙන් එය පසට ඒකාබද්ධ වීමට ඉඩ සැලසෙන අතර ශාක මුල් වර්ධනය වීමට පටන් ගත් පසු එය පහසුවෙන් අවශෝෂණය කර ගත හැකිවේ. විශේෂයෙන් ශාක වර්ධනයේ මුල් අවධියේදී, මුල් වර්ධනය සඳහා පොස්පරස් තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි.

මෙම පසහි පෝෂක වේගයෙන් කාන්දු වන බැවින්, පොහොර (යූරියා සහ MOP) කෙටි කාලාන්තර වලින් කොටස්කර යෙදීම මගින් පෝෂක ඉවත් වීම වලක්වා ගත හැකි වේ. කැල්සියම් නයිට්‍රේට් ($Ca(NO_3)_2$) යෙදීම මගින්, ශාක වර්ධනයට අත්‍යවශ්‍ය නයිට්‍රජන් මෙන්ම කැල්සියම් යන පෝෂකයද සැපයීම සිදු කල හැකිය. කැල්සියම් මගින් ශාක සෛල බිත්ති ශක්තිමත් කරන අතර කඳන් සහ කොළ සෞඛ්‍ය සම්පන්නව ප්‍රවර්ධනය කරයි. පළිබෝධ සහ රෝග වලට ප්‍රතිරෝධය වැඩි කරයි. කැල්සියම් ඌනතා ආබාධ වැළැක්වීමට උපකාරී වේ. පසෙහි වැලි සහිත ස්වභාවය සමඟ තෙතමනය රඳවා තබා ගැනීම අඩු අතර එමඟින් ශාක මුල් මගින් කැල්සියම් අවශෝෂණය සීමා විය හැකිය. කැල්සියම් පත්‍ර මතට ඉසීම මගින් මෙම තත්වය වළක්වා ගත හැකිය.

කල්පිටිය ප්‍රදේශය සඳහා විශේෂිත පොහොර පැකේජය පහත වගුවේ දැක්වේ.

| පොහොර | යොදන කාලය | | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | පැළ සිටුවීමට පෙර | මූලික පොහොර | සති 1කට පසු | සති 3කට පසු | සති 6කට පසු | සති 8කට පසු | |
| ගොම පොහොර (ටොන්/හෙක්.) | 10 | - | - | - | - | - | 10 |
| TSP (කි.ග්‍රෑ./හෙක්.) | - | 215 | - | - | - | - | 215 |
| Urea (කි.ග්‍රෑ./හෙක්.) | - | 20 | 60 | 90 | 90 | 90 | 350 |
| MOP (කි.ග්‍රෑ./හෙක්.) | - | 10 | 20 | 70 | 70 | 70 | 240 |
| $Ca(NO_3)_2$ - ලීටර් 16 යේ ඉසින ටැංකියකට ග්‍රෑම් 80 බැගින් හෙක්ටයාරයකට ටැංකි 25 ක් සිටුවා සති 3 කට හා සති 6 කට පසු බෝගයට (පත්‍ර වලට) ඉසින්න. | | | | | | | |

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය එක්ව ක්‍රියාත්මක කරන ශ්‍රී ලංකාව තුළ පලිබෝධනාශක හා පොහොර ආරක්ෂිතව හා නිවැරදි ලෙස භාවිතය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය මගින් සකසන ලදී

2025 නොවැම්බර්